සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 60 S I

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

කාලය පැය 01 යි

සැලකිය යුතුයි.
* සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
* අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරාගන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (X) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස්ද සැලකිල්ලෙන් කියවා ඒවාද පිළිපදින්න.

පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් 1 සිට 5 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. ආහාර තාක්ෂණවේදී උපාධිධාරිණියක වන සචිනි විජේකෝන් "රසමියුරු"නමින් දේශීය නැවුම් පළතුරු වෙළඳසැලක් ඇගේම ගොඩනැගිල්ලක පවත්වාගෙන යන්නීය. ඇය ප්‍රදේශයේ සිටින ගොවීන්ගෙන් පළතුරු මිලදීගෙන කසුනිගේ ආපනශාලාවටත් පාරිභෝගිකයන්ටත් අලෙවිකරයි.

(01) "රස මියුරු" ව්‍යාපාරය සපුරාලනු ලබන වුවමනාවක් වන්නේ,
1. සෞඛ්‍යය  2. ආහාර  3. පේර  4. ජෑම්

(02) මෙම සිද්ධිය සඳහන් සචිනිගේ පළතුරු ව්‍යාපාරය,
1. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි.  2. සේවා සපයන ව්‍යාපාරයකි.
3. ලාභ අරමුණු කරනොගත් ව්‍යාපාරයකි.  4. හවුල් ව්‍යාපාරයකි.

(03) "රස මියුරු" ව්‍යාපාරය පවත්වාගෙන යන ගොඩනැගිල්ල අයත්වන නිෂ්පාදන සාධකය කුමක්ද?
1. භූමිය  2. ශ්‍රමය  3. ප්‍රාග්ධනය  4. ව්‍යවසායකත්වය

(04) මෙම සිද්ධියේ සඳහන් කසුනිගේ ආපනශාලාව රස මියුරු ව්‍යාපාරයේ,
1. ගණුදෙනුකරුවෙකි.  2. සැපයුම්කරුවෙකි.  3. තරඟ කරුවෙකි.  4. සේවකයෙකි.

(05) "රස මියුරු" ව්‍යාපාරනාමය ලියාපදිංචි කිරීමේ බලධරයා වනුයේ,
1. ප්‍රාදේශීය සභාවේ සභාපති  2. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමා
3. පළාත් සභාවේ සභාපති  4. පළාත් සභාවේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා

(06) සේවාවකට සුවිශේෂී වූ ලක්ෂණයක් වන්නේ,
1. භෞතික පැවැත්මක් තිබීම.  2. ස්පර්ශ කල හැකි වීම.
3. නිෂ්පාදනය සඳහා පිරිවැයක් දරා තිබීම  4. අයිතිකරුගෙන් වෙන්කල හැකිවීම.

(07) පහත ප්‍රකාශ අතුරින් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. නිෂ්පාදිත සාධාරණ මිලට ලබා ගැනීම ගණුදෙනුකරුවන්ගේ අරමුණකි.
2. රැකියා අවස්ථා උත්පාදනය කිරීම සේවකයන්ගේ අරමුණකි.
3. දැඩි තරඟකාරීත්වයකට මුහුණ දීමට සිදුවීම ගෝලීය පරිසරයේ අහිතකර බලපෑමකි.
4. කළමනාකරුවන් ව්‍යාපාරයේ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය තීරණ ගැනීම සිදුකරයි.

(08) ව්‍යාපාරයක ශක්තීන් හා අවස්ථා කීපයක් පහත දැක්වේ.
A - අයිතිකරුට ව්‍යාපාරික දැනුමක් හා පළපුරුද්දක් තිබීම.  B - අධිවේගී මාර්ග ඉදිවීම.
C - රජය අඩුපොලී ණය ක්‍රම හඳුන්වාදීම.  D - සේවකයින්ගේ විශේෂ දැනුම හා කැපවීම.

මෙහි සඳහන් ශක්තීන් පමණක් ඇතුලත් පිළිතුර වන්නේ,
1. A හා B  2. B හා C  3. A හා D  4. A,C හා B

(09) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේදී සලකාබලනු ලබන සාධක වන්නේ,
1. භාවිතාකරන බලශක්ති ප්‍රමාණය, සේවක සංඛ්‍යාව, ප්‍රාග්ධන ප්‍රමාණය
2. හිමිකාරීත්වය, අරමුණු, ප්‍රාග්ධන ප්‍රමාණය
3. ලාභ අරමුණ, වෙළඳපල කොටස, සේවක සංඛ්‍යාව
4. සේවක සංඛ්‍යාව, වෙළඳපල කොටස, හිමිකාරීත්වය

(10) පහත දැක්වෙන්නේ ව්‍යාපාර සංවිධානයක වර්ග 03ක් හා ඒවාට අදාල ලක්ෂණ කිහිපයක් ඇතුලත් වගුවකි.

| සංවිධාන වර්ගය | වගකීම | නීතිමය පුද්ගලභාවය |
|---|---|---|
| 1. කේවල ස්වාමී | අසීමිතයි | A |
| 2. සමුපකාර | සීමිතයි | B |
| 3. සංස්ථාපිත සමාගම් | C | ඇත |

ඉහත වගුවේ ABC හිස්තැන් වලට අදාල ලක්ෂණ පිළිවෙලින් දැක්වෙන පිළිතුරු කාණ්ඩය තෝරන්න.
1. A - ඇත B - ඇත C - සීමිතයි 2. A - නැත B - නැත A - සීමිතයි
3. A - නැත B - ඇත A - සීමිතය 4. A - නැත B - නැත A - අසීමිතයි

(11) ඒක පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කිරීමෙන් පසුව ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත ඉදිරිපත් කල යුත්තේ, දින කීයක් ඇතුලතද?
1. දින 07 2. දින 14 3. දින 21 4. දින 28

(12) "අද මධ්‍යම රාත්‍රී 12.00 සිට පෙට්‍රල් මිල රු. 10.00 කින් ඉහලට". මෙය ප්‍රවෘත්ති ප්‍රකාශයකින් උපුටා ගත්තකි. මෙම ප්‍රකාශයට අනුව වඩාත් නිවැරදියයි සිතිය හැකි වගන්තිය වන්නේ,
1. ආර්ථික පරිසරයට අයත්වන අතර ව්‍යාපාරයට දුර්වලතාවයකි.
2. දේශපාලන පරිසරයට අයත්වන අතර ව්‍යාපාරයට අවස්ථාවකි.
3. දේශපාලන පරිසරයට අයත්වන අතර ව්‍යාපාරයට තර්ජනයකි.
4. ආර්ථික පරිසරයට අයත්වන අතර ව්‍යාපාරයට අභියෝගයකි.

(13) පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩිවූත් පුද්ගලයින් විස්සක් හෝ ඊට නොවැඩිවූත් පිරිසක් විසින් ලාභ ලැබීමේ අරමුණින් පවත්වාගෙන යන ව්‍යාපාර සංවිධානයක් ලියාපදිංචි කල යුත්තේ,
1. 1918 අංක 6 දරන ව්‍යාපාර නාම ආඥාපනත යටතේ. 2. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත යටතේ.
3. 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ. 4. 1972 අංක 5 සමුපකාර සමිති පනත යටතේ.

(14) සීමාසහිත පොදු සමාගමකට වැඩිපුර ප්‍රාග්ධනය සපයා ගැනීමේ හැකියාව ලැබී ඇත්තේ,
1. නෛතික පුද්ගලභාවයක් තිබීම නිසාය. 2. සාමාජික සංඛ්‍යාව සීමා නොකිරීම නිසාය.
3. කොටස් හිමියන්ගේ වගකීම සීමිත නිසාය. 4. ණයකර නිකුත් කිරීමට අවසර ඇති නිසාය.

(15) අනෙකුත් ව්‍යාපාර සංවිධාන වලට සාපේක්ෂව සමුපකාර සංවිධාන ක්‍රමයේ පවතින වාසියක් වනුයේ,
1. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තිබීම. 2. ආර්ථික ප්‍රතිලාභ රජය සතුවීම.
3. පෞද්ගලික අංශයේ ඒකාධිකාරී බලපෑමක් තිබීම. 4. විශාල ප්‍රාග්ධනයකින් ආරම්භ කල හැකි වීම.

(16) සමාගම් පනත හැර වෙනත් නීතියක් යටතේ සංස්ථාපනය කල පූර්ණ අයිතිය රජය සතුවන හෝ අයිතියෙන් වැඩි ප්‍රමාණයක් රජය සතුවන ව්‍යාපාර සංවිධානය වන්නේ,
1. රාජ්‍ය සංස්ථා 2. රාජ්‍ය දෙපාර්තමේන්තුව 3.රාජ්‍ය සමාගම් 4. සමුපකාර සමිති

(17) ව්‍යාපාර ඒකක සංකල්පයට අදාල ප්‍රකාශය තෝරන්න.
1. ගිණුම්කරණයේදී මුදලින් මැනිය හැකි දෑ පමණක් ගිණුම් තබන බවයි.
2. ව්‍යාපාරිකයා ගිණුම්කරණ ප්‍රතිඵල ගිණුම්ගත කරන බවයි.
3. ව්‍යාපාරයට අයිතිකරුවන්ගෙන් වෙන්වූ ස්වාධීන පැවැත්මක් ඇති බවයි.
4. ව්‍යාපාරයට දිගුකාලීනව පැවැත්මක් ඇති බවයි.

(18) පහත ප්‍රකාශනය අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. අතීත ගණුදෙනුවක හෝ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ව්‍යාපාරය විසින් ගෙවිය යුතු අගය වත්කම් ලෙස හැඳින්වේ.
2. හිමිකමෙහි සිදුවන අනෙකුත් වැඩිවීම් වියදම් ලෙස හැඳින්වේ.
3. ව්‍යාපාරක හිමිකරුවන් වෙනුවෙන් පවතින වත්කම් ප්‍රමාණය හිමිකම ලෙස හැඳින්වේ.
4. හිමිකමෙහි සිදුවන සියළුම වැඩිවීම් ආදායම් ලෙස හැඳින්වේ.

(19) පහත දී ඇති අයිතම අතුරින් වියදම් පමණක් ඇතුලත් ශීර්ෂය වන්නේ,
1. දුන් වට්ටම්, විදුලිය, ගෙනයාමේ කුලී, ගැනුම්
2. ප්‍රචාරණය, විකුණුම් කොමිස්, ගැනිලි, වේතන
3. දුන් වට්ටම්, ගොඩනැගිලි ක්ෂය, බඩු තොගය, බැංකු ණය
4. ණය පොලී, ගෙවිය යුතු විදුලි ගාස්තු, දුන් වට්ටම්, වේතනය

(20) සඳුනි නවෝද්‍යාගේ ව්‍යාපාරයේ 2018.01.01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත පරිදි විය.
වත්කම් = හිමිකම් + වගකීම්
425000 = 350000 + 75000
එදින සිදුවූ ගණුදෙනුවක් නිසා සමීකරණය පහත පරිදි වෙනස් විය.
වත්කම් = හිමිකම් + වගකීම්
450000 = 375000 + 75000

2018.01.01 දින සිදු වූ ගණුදෙණුව විය හැක්කේ,
1. අයිතිකරු රු. 25000 ගැනිලි සිදු කිරීම. 2. රු. 25000 බැංකු ණයක් ලබා ගැනීම.
3. රු. 25000 ක බඩු තොගයක් රු. 50000 ණයට විකිණීම. 4. රු. 25000ක භාණ්ඩ වික්‍රමගෙන් ණයට ගැනීම.

(21) පහත ගණුදෙනු අතුරින් හිමිකම අඩු වීමට බලපාන ගණුදෙනුව වන්නේ,
1. අයිතිකරු රු. 50000ක් අමතර ප්‍රාග්ධනය යෙදවීම.
2. ලැබූ කොමිස් ආදායම රු. 20000
3. රු. 40000 ණය හිමියෙකුට 10% වට්ටමකට යටත්ව මුදල් ගෙවීම.
4. රු. 25000ක බැංකු ණය වාරිකය රු. 5000 ක පොළියක් සමග ගෙවීම.

(22) ව්‍යාපාරයේ සිදු වූ ගණුදෙනුවකට අදාල ද්විත්ව සටහන පහත පරිදි වේ.
ණය හිමි ගිණුම (හර) 16000
මුදල් ගිණුම (බැර) 16000
සිදු වී ඇති ගණුදෙණුව වන්නේ,
1. රු. 16000 ක බඩු තොගයක් ණයට ගැනීම.
2. රු. 16000 ක මුදලක් ණය හිමියන්ට ගෙවීම.
3. රු. 16000 ක බඩු මුදලට ගැනීම.
4. රු. 16000 ක ණය හිමියන්ගෙන් මුදල් ලැබීම.

(23) ව්‍යාපාරයක් රු. 8000 වරිපනම් බදු මුදලින් ගෙවීම සටහන් කිරීමට අදාල කරගන්නා මූලාශ්‍ර ලේඛනය හා මූලික පොත පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
1. ගෙවීම් වවුචරය - මුදල් පොත
2. මුදල් පොත - ගෙවීම් වවුචරය
3. ජ'නල් වවුචරය - මුදල් පොත
4. ගෙවීම් වවුචරය - සුළු මුදල් පොත

(24) ව්‍යාපාරයක සුළු මුදල් පොතක් පවත්වාගෙන යාමේ වාසියක් වන්නේ,
1. ප්‍රධාන මුදල් පොතේ ගණුදෙනු නිවැරදි බව තහවුරු කරගත හැකිවීම.
2. ප්‍රධාන මුදල් භාරකරුගේ කාර්යභාරය අඩුකරගත හැකිවීම.
3. ව්‍යාපාරයේ සුළු මුදල් දූනගත හැකි වීම.
4. සුළු මුදලින් කල ගෙවීම් ප්‍රතිපූර්ණය කළ හැකිවීම.

(25) සදීපනීගේ ව්‍යාපාරයේ 2018.03.31 දිනට තුලනය කරන ලද බැංකු ගිණුමේ ශේෂය රු. 14000 බැර ශේෂයක් විය. මෙය සදීපනිගේ ව්‍යාපාරයට,
1. වගකීමකි.
2. වත්කමකි.
3. ආදායමකි.
4. වියදමකි.

(26) අංජලිගේ ව්‍යාපාරය විසින් රු. 30000.00 බඩු තොගයක් රුවිනිට ණයට විකුනූ අතර රුවිනි විසින් එම මුදල 10% වට්ටමකට යටත්ව අංජලීට ගෙවා දමන ලදී. රුවිනිගේ ව්‍යාපාරය මෙම ගණුදෙනුව සටහන් කරන මූලික පොත හා වට්ටම් සටහන් කිරීම පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. ගැණුම් ජ'නලය - රුවිනිට ලැබූ වට්ටම රු. 3000/=
2. විකුණුම් ජ'නලය - රුවිනිට ලැබූ වට්ටම රු. 3000/=
3. ගැනුම් ජ'නලය - අංජලීට ලැබූ වට්ටම රු. 3000/=
4. විකුණුම් ජ'නලය - අංජලීට ලැබූ වට්ටම රු. 3000/=

(27) ව්‍යාපාරයක් ණය හිමියෙකුට චෙක්පතකින් මුදල් ගෙවීම සටහන් කිරීමට අදාල වන මූලික පොත වනුයේ,
1. පිළිපතය
2. වවුචරය
3. මුදල් ගිණුම
4. බැංකු ගිණුම

(28) කසුනි චේතනාගේ ව්‍යාපාරයේ 2017 වර්ෂයේ තොරතුරු කීපයක් පහත දූක්වේ.

| | |
|---|---|
| 2017.1.1 ප්‍රාග්ධනය | 300000.00 |
| වර්ෂයේ ආදායම් | 140000.00 |
| වර්ෂයේ වියදම් | 60000.00 |
| අතිරේක ප්‍රාග්ධන යෙදවීම් | 80000.00 |

2017. 12.31 දිනට අයිතිකරුගේ හිමිකම වන්නේ,
1. රු. 580,000.00
2. රු. 460,000.00
3. රු. 380,000.00
4. රු. 180,000.00

(29) පහත දී ඇති වගන්ති අතුරින් සාවද්‍ය වගන්තිය වන්නේ,
1. මූලික පොත් වල ගණුදෙන් සටහන් කරන්නේ මූලාශ ලේඛන උපයෝගී කර ගනිමිනි.
2. බැංකු ගිණුම් පිළියෙල කිරීමේදී බැංකු ප්‍රකාශය, පිළිපත මූලාශ ලේඛන ලෙස භාවිතා කල හැකිය.
3. මූලික සටහන් පොත් පිළියෙල කරන්නේ ගිණුම් පිළියෙල කිරීම වෙනුවටය.
4. මූලාශ ලේඛන පිළිගත හැකි වන්නේ එය වගකිව යුතු නිලධාරියකු අනුමත කල විටය.

(30) ව්‍යාපාරයක දුන් වට්ටම් ගිණුම් ගත කිරීමට අදාල ද්විත්ව සටහන වන්නේ,
1. මුදල් ගිණුම (හර)
ණය ගැති ගිණුම (බැර)
2. බැංකු ගිණුම (හර)
ණය ගැති ගිණුම (බැර)
3. දුන් වට්ටම් ගිණුම් (හර)
ණය ගැති ගිණුම (බැර)
4. ණය ගැති ගිණුම (හර)
දුන් වට්ටම් ගිණුම (බැර)

(31) සවන්දි විදූෂාගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු. 4000.00 යි. 2018.3.1 සුළු මුදල් භාරකරු අත රු. 600.00 ක ඉතිරිව තිබුණි. 2018.3.31 සුළු මුදල් වියදම පහත පරිදි විය.

| | |
|---|---|
| සංග්‍රාහ වියදම් | 1200.00 |
| ලිපි ද්‍රව්‍ය වියදම් | 600.00 |
| ගමන් වියදම් | 1100.00 |
| විවිධ වියදම් | 700.00 |

2018.04.01 ප්‍රතිපූර්ණ කල යුතු මුදල කොපමණද?
1. රු. 600.00 2. රු. 3400.00 3. රු. 3600.00 4. රු . 4000.00

(32) ශේෂ පිරික්සුමක සාමාන්‍යයෙන් හර පැත්තේ සඳහන් වන ගිණුම් ශේෂ පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.
1. ප්‍රාග්ධන ගිණුම, ආදායම් ගිණුම, වත්කම් ගිණුම 2. වත්කම් ගිණුම, වියදම් ගිණුම, ගැනිලි ගිණුම
3. වගකීම් ගිණුම, ආදායම් ගිණුම, හිමිකම් ගිණුම 4. වත්කම් ගිණුම, වගකීම් ගිණුම, වියදම් ගිණුම

(33) පහත දැක්වෙන්නේ ගිණුම්කරණයේ සිදුවූ වරදක් නිවැරදි කිරීමට තබා ඇති ද්විත්ව සටහනකි.
පරිගණක උපකරණ ගිණුම (හර) 140000
පරිගණක අළුත්වැඩියා ගිණුම (බැර) 140000

ව්‍යාපාරයේ ගිණුම් පොත්වල සිදු වී ඇතැයි සිතිය හැකි වරද වන්නේ,
1. රු. 140000 ක පරිගණක මිලට ගැනීම මුදල් පොතේ පමණක් සටහන්ව තිබීම.
2. රු. 140000 ක පරිගණක අළුත් වැඩියා කිරීම පරිගණක ගිණුමේ සටහන්ව තිබීම.
3. පරිගණක රු. 140000 මිලට ගැනීම පරිගණක අළුත් වැඩියා ගිණුමේ සටහන්ව තිබීම.
4. රු. 140000 ක පරිගණක මිලට ගැනීම පොත් වල සටහන්ව නොතිබීම.

(34) හිරුණි වෙළඳසැලට ණයට විකුණුම් රු. 10000 හිරුණි වෙළඳසැල් ගිණුමේ බැරට සටහන් කර තිබීම නිවැරදි කිරීමට අදාල ද්විත්ව සටහන වන්නේ,
1. හිරුණි වෙළඳසැල (හර) 10000
අවිනිශ්චිත ගිණුම (බැර) 10000
2. අවිනිශ්චිත ගිණුම (හර) 10000
හිරුණි වෙළඳසැල (බැර) 10000
3. අවිනිශ්චිත ගිණුම (හර) 20000
හිරුණි වෙළඳසැල (බැර) 20000
4. හිරුණි වෙළඳසැල (හර) 20000
අවිනිශ්චිත ගිණුම (බැර) 20000

(35) ව්‍යාපාරයක පොදු ජ'නලයේ සටහන් නොකරන ගනුදෙනුව තෝරන්න.
1. ව්‍යාපාරයේ මෝටර් රථය මුදලට විකිණීම.
2. අයිතිකරු රු. 200000 වටිනා ගොඩනැගිල්ල ව්‍යාපාරයේ යෙදවීම.
3. මොටර් රථයක් රු. 100000 ණයට විකිණීම.
4. රු. 80000ක පරිගණකයක් දම්රෝ සමාගමින් ණයට ගැනීම.

(36) බැංකු ගිණුම සංශෝධනය කිරීමේදී බැංකු ප්‍රකාශනයෙන් උපුටා ගත යුතු ශේෂයක් වන්නේ,
1. නිශ්කාශණය නොවූ චෙක්පත් වල වටිනාකම 2. ස්ථාවර නියෝග මත කර ඇති ගෙවීම්
3. ව්‍යාපාරය විසින් තැන්පත් කල උපලබ්දි නොවූ චෙක් 4. බැංකුව විසින් සිදු කරන ලද ලබන වැරදි

(37) බැංකු සැසඳුම් විස්තරයේ අර්ථය දැක්වෙන් වගන්තිය වන්නේ,
1. බැංකු ගිණුමේ ශේෂයක් බැංකු ප්‍රකාශනයේ ශේෂයත් සමග සැසඳීමට සකස් කරන්නකි.
2. බැංකුව විසින් බැංකු ගිණුමේ ශේෂය සෙවීමට සකස් කරන්නකි.
3. බැංකු ගිණුමේ වරදක් ඇති විට බැංකුව විසින් එවනු ලබන ප්‍රකාශයකි.
4. බැංකු ගිණුම වැසූ විට බැංකුව එවන ප්‍රකාශයකි.

*** පහත තොරතුරු ඇසුරෙන් 38, 39 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

2018 ඔක්තොම්බර් 30 දිනට බැංකු පොතේ ශේෂය 18000කි. බැංකු පොතේ සටහන් නොවූ නිත්‍ය නියෝග මත කර ඇති ගෙවීම් රු 6000කි. බැංකු ගාස්තු රු. 1000කි. නිකුත් කල ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් වල වටිනාකම රු. 14000කි.

(38) 2018 ඔක්තොම්බර් 30 දිනට සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය වන්නේ,
1. රු. 11000 2. රු. 17000 3. රු. 25000 4. රු. 32000

(39) 2018 ඔක්තොම්බර් 30 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය වන්නේ,
1. රු. 4000 2. රු. 11000 3. රු. 25000 4. රු. 32000

(40) ශේෂ පිරික්සුමක් පිළියෙල කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ,
1. ද්විත්ව සටහන් වල නිවැරදි බව තහවුටරු කර ගැනීමට
2. ලාභාලාභ තත්වය තහවුරු කර ගැනීමට
3. වත්කම්, වගකීම්, හිමිකම් වල වටිනාකම් තහවුරු කර ගැනීමට
4. ගණිතමය නිවැරදිතාවය තහවුරු කර ගැනීමට

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 60 S II

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

කාලය පැය 02 යි

**සැලකිය යුතුයි.**

* පළමු වන ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක්ද II කොටසින් ප්‍රශ්න දෙකක්ද සමඟ ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) පහත සඳහන් සිද්ධීන් ඇසුරින් i - x දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සෙව්මිණී, කාවින්දයා, ඖෂධවේදී පාඨමාලාවක් හදාරා වෙළඳපල අධීක්ෂණයකින් අනතුරුව 2018.01.01 රු.500000/= ක මුදලක් හා රු. 400000/= වටිනා ගොඩනැගිල්ලක් යොදා "ඔසුමිණි ෆාමසි" නමින් ව්‍යාපාරයක් ආරම්භ කළාය. ප්‍රදේශයේ ජනතාවට ඖෂධ මිලදී ගැනීමට ප්‍රමාණවත් පහසුකම් නොමැති වීමත් ආසන්නයේ වෛද්‍ය සායන කීපයක් පවත්වා ගෙන යාමත් ඇයගේ ඖෂධ ඉල්ලුම වැඩිවීමට හේතුවිය. එම ව්‍යාපාරයේ 2018 ජනවාරි මාසයේ සිදුවූ ගණුදෙනු පහත දැක්වේ.

01. ගොඩනැගිල්ල අළුත්වැඩියා කලා රු 30000/=
02. උපකරණ මිලට ගැනුම් රු 150000/=
03. ඖෂධ ගැනුම් 300 000/=
04. සේවකයාට වැටුප් ගෙව්වා 15000/=
05. ඖෂධ විකුණුම් 180000/=
06. බැංකු ණය ගත්තා 150000/=
07. විදුලි බිල ගෙව්වා 4000/=

i. (අ) "ඔසුමිණි ෆාමසි" ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත්ද?
   (ආ) මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තියක් ලියන්න.

ii. (අ) "ඔසුමිණි ෆාමසි" ව්‍යාපාරය ලියාපදිංචි කල යුතුද?
   (ආ) ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

iii. (අ) මෙම ව්‍යාපාරය සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක්ද?
   (ආ) ඊට අදාලව වුවමනාවක් නම් කරන්න.

iv. (අ) මෙම ව්‍යාපාරයට ඇල්මැති පාර්ශව දෙකක් නම් කරන්න.
   (ආ) මෙහි ඇති ව්‍යාපාර අවස්ථාවක් වන්නේ?

v. 2018.01.01 මූලික ගිණුම් සමීකරණය අගයන් සහිතව ඉදිරිපත් කරන්න.

vi. අංක (6) ගණුදෙනුව සටහන් කිරීමට අදාල මූලාශ්‍ර ලේඛනය හා මූලික පොත නම් කරන්න.

vii. සෙව්මිණී බැංකු ජංගම ගිණුමක් විවෘත කිරීමට කැමැත්තෙන් සිටී. ජංගම ගිණුමක් ඇරඹීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන 2ක් ලියන්න.

viii. අංක (2) ගණුදෙනුවට අදාල ද්විත්ව සටහන ලියා දක්වන්න. වටිනාකම සහිතව.

ix. ව්‍යාපාරයේ වත්කම් අඩුවීම හා වියදම් වැඩිවීමට අදාල ගණුදෙනු නම් කරන්න.

x. 2018.01.31 මුදල් පොත පිළියෙල කොට අත ඉතිරි මුදල් ශේෂය සොයන්න.

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(02) i. (අ) වුවමනාවල දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න.
   (ආ) භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් 2ක් නම් කරන්න.

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.
   (අ) සෑම ව්‍යාපාරයක්ම කටයුතු කරන්නේ යම් සුවිශේෂී අරමුණක් හෝ අරමුණු කීපයක් ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන්ය ( )
   (ආ) ව්‍යාපාරයක් විසින් පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා පාරිභෝගිකයා වෙත ලබා දෙන ක්‍රියාවක් හෝ ක්‍රියාවලියක් නිෂ්පාදිත ලෙස හඳුන්වයි. ( )
   (ඉ) සන්නම් නාමයක් තිබීම ව්‍යාපාර ශක්තියක් වන අතර නව නගර බිහිවීම ව්‍යාපාර තර්ජනයකි. ( )
   (ඊ) ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ කර්මාන්තවල පිරිහීමට ගෝලීයකරණය ඉවහල් වී ඇත. ( )

iii. (අ) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය කිරීම ව්‍යාපාරිකයාට වැදගත් වන්නේ ඇයි?
(ආ) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑමක් ලියන්න.

iv. (අ) ව්‍යාපාර කෙරෙහි උනන්දුවන පාර්ශවයකි රජය. ඇල්මැති පාර්ශවයක් ලෙස රජය ව්‍යාපාර කෙරෙහි උනන්දුවීමේ අරමුණු දෙකක් නම් කරන්න.
(ආ) තාක්ෂණික පරිසරය තර්ජනයක් වූ ව්‍යාපාර ක්ෂේත්‍රයක් සඳහන් කරන්න.

(03) i. සුගන්ධි විජේකෝන් විසින් බෝනික්කන් නිෂ්පාදය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම ව්‍යාපාරයට අදාල නිෂ්පාදන සාධක 02ක් හා නිදසුන් දෙකක් ලියන්න.

| නිෂ්පාදන සාධකය | නිදසුන |
|---|---|
| 1.<br>2. | |

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.
(අ) නව තාක්ෂණික ක්‍රම සඳහා අනුගතවීම දුෂ්කරවීම ව්‍යාපාරයක දුර්වලතාවයකි. ( )
(ආ) භාණ්ඩ හා සේවා අලෙවියේදී පොදු මිල ගණන් අඛණ්ඩව ඉහල යාම උද්ධමනයයි. ( )
(ඉ) ව්‍යාපාරයක පැවැත්ම රඳා පවතින්නේ ගනුදෙනුකරුවන් මතය. ( )
(ඊ) ව්‍යාපාර වලට අවශ්‍ය අරමුදල් යොදවමින් එහි අවධානම දරන පුද්ගලයෝ කලමනාකරුවන් වෙති. ( )

iii. පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහාත්, නිෂ්පාදකයා, ව්‍යාපාරිකයා ආරක්ෂා කිරීම සඳහාත් නෛතික පරිසරය විසින් ක්‍රියාත්මක කර ඇති අණපනත් දෙකත් නම් කරන්න.

iv. වර්තමාන පාරිභෝගිකයා තම අවශ්‍යතා හා වුවමනා වෙළඳපල මඟින් සපුරාගනී. වෙළඳපල තුල සිටින විවිධ ව්‍යාපාරවල පොදු ලක්ෂණ 2ක් ලියන්න. (ලකුණු 2x4= 8)

(04) i. බිස්කට් නිෂ්පාදන ව්‍යාපාරයක නිෂ්පාදන කළමනාකරුවෙකු ලෙස සේවය කළ කවීෂ ඔහුගේම බිස්කට් නිෂ්පාදන ව්‍යාපාරයක් ඇරඹීමට අදහස් කරයි. මෙම ව්‍යාපාරයට එකතුවීමට ඔහුගේ හොඳම මිතුරා වන සුදීර කැමැත්තෙන් සිටී.
(අ) මිතුරන් දෙදෙනාට ප්‍රවේශ වීමට සුදුසු ව්‍යාපාර සංවිධානයක් ලියන්න.
(ආ) එම ව්‍යාපාර සංවිධානයේ වාසියක් හා අවාසියක් ලියන්න.

ii. පහත ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.
(අ) සීමිත වගකීමක් සහිතව ලියාපදිංචි කිරීම ඒක පුද්ගල ව්‍යාපාරවල ලක්ෂණයකි. ( )
(ආ) සමාගමක කොටස්කරුවන් මිය යාම, බුංවත් වීම වැනි හේතු සමාගමේ පැවැත්මට බාධාවක් නොවේ. ( )
(ඉ) පෞද්ගලික අංශයේ ඒකාධිකාරී බලපෑම් අවම කිරීමට දායක වීම රාජ්‍ය සංස්ථාවල අවාසියකි. ( )
(ඊ) අමාත්‍යාංශයක් යටතේ ක්‍රියාත්මක වන මුළුමනින්ම රජයේ සෘජුපාලනයට අයත්වන ආයතන සමුපකාර සමිතිවේ. ( )

iii. (අ) හවුල් ව්‍යාපාරයක ඇති හවුල් ගිවිසුම කෙටියෙන් හඳුන්වන්න.
(ආ) හවුල් ගිවිසුමක් ඇති කර ගැනීමෙන් අත්කරගත හැකි වාසියක් ලියන්න.

iv. (අ) සංස්ථාපිත සමාගම් වල දැකිය හැකි වාසියක් හා අවාසියක් ලියන්න.
(ආ) රාජ්‍ය දෙපාර්තමේන්තුවල දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 2x4= 8)

## II කොටස - ගිණුම්කරණය

(05) i. (අ) ගිණුම්කරණයේ අරමුණු කුමක්ද?
(ආ) ව්‍යාපාරයක සම්පත් හුවමාරුවට අමතරව ව්‍යාපාරයට සම්බන්ධ ඇතැම් සිද්ධිද ගිණුම්කරණ ගණුදෙනු ලෙස සැලකිල්ලට ගනු ලැබේ. එවැනි සිද්ධියකට නිදසුනක් සපයන්න. (ල. 2)

ii. නවෝද්‍යා ගිම්හානිගේ ව්‍යාපාරයේ 2018 මැයි මාසයේ සිදුවූ ගණුදෙනු ගිණුම්කරණ සමීකරණයක සටහන් කර ඇති ආකාරය පහත දැක්වේ.

| ගණුදෙනු | වත්කම් | | | | හිමිකම | වගකීම | |
|---|---|---|---|---|---|---|---|
| අංක | මෝ. රථ | තොගය | ණය ගැති | මුදල් | | ණය හිමි | බැංකු ණය |
| 1 | 400000 | | | 200000 | 600000 | | |
| 2 | | 100000 | | | | 100000 | |
| 3 | | | | 150000 | | | 150000 |
| 4 | | - 50000 | 70000 | | 20000 | | |

(ල. 4)

iii. සිල්ලර වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන පාරමීගේ ව්‍යාපාරයේ පහත දක්වා ඇති අයිතම වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම්, වියදම් යන ශීර්ෂ යටතේ වර්ග කරන්න.
(අ) ප්‍රචාරණය (ආ) විකුණුම් (ඉ) ගැනිලි (ඊ) ආයෝජන
(උ) ණය හිමියෝ (ඌ) ණය පොලී

iv. චමෝදි නිපුණිකාගේ ව්‍යාපාරයේ 2018 අගෝස්තු මාසයට අදාල ගණුදෙනු කීපයක් තොරතුරු පහත දැක්වේ.

| දිනය | ඉන්වොයිස් අංකය | ගැනුම්කරු | ඉන්වොයිස් වටිනාකම | අමතර තොරතුරු |
|---|---|---|---|---|
| 2018.08.10 | 34 | සවින්දි | 16000 | 5% වෙළඳ වට්ටමක් හිමිවීම |
| 2018.08.14 | 35 | සුගන්ධි | 38000 | - |
| 2018.08.23 | 36 | කාවින්දි | 15000 | 2% වෙළඳ වට්ටමක් හිමිවීම |

**අවශ්‍ය වන්නේ,**
(අ) අගෝස්තු මාසයට අදාල විකුණුම් ජ'නලය
(ආ) අදාල ලෙජර් ගිණුම් (ල. 4)

(06) i. (අ) ව්‍යාපාරයක් පිළියෙල කරන මූලාශ්‍ර ලේඛන වල ප්‍රයෝජන දෙකක් නම් කරන්න.
(ආ) ව්‍යාපාරයක් විසින් මූපිකපොත් පිළියෙල කළ යුත්තේ ඇයි? කරුණු දෙකක් ඉදිරිපත් කරන්න. (ල. 2)

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.
(i) මූලික පොත්වල ගණුදෙනු සටහන් කිරීමෙන් පසු ඒවා ලෙජර් ගිණුම්වලට පිටපත් කල යුතුය. ( )
(ii) ස්ථාවර වත්කම් ණයට ගැනීම පොදු ජ'නලයේ සටහන් කරයි. ( )
(iii) ව්‍යාපාරයක අයිතිකරු විසින් භාණ්ඩ ගැනිලි ලබා ගැනීම සටහන් කරන මූලික පොත මුදල් පොතය. ( )
(iv) සෘජුප්‍රේෂණ නිසා බැංකු ගිණුමේ ශේෂය වැඩි විය යුතුය. ( )
(ල. 2)

iii. 2018.03.01 දිනට පහත දැක්වෙන ශේෂයන් භාග්‍යාගේ ව්‍යාපාරයෙන් උපුටාගන්නා ලදී.

| ණය ගැති | | ණය හිමි | |
|---|---|---|---|
| රශ්මි | 20000 | අකලංක | 18000 |
| විශ්මි | 15000 | දිල්හාර | 24000 |
| මුදල් ශේෂය | 64000 | | |

මාර්තු මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයක පහත දැක්වේ.
03.07 රශ්මිගෙන් ලද මුදල 12000
03.11 අකලංකට ගෙවූ මුදල 14000 වට්ටම 1000
03.18 විශ්මිගෙන් ලැබිය යුතු මුළු මුදල 10% වට්ටමකට යටත්ව ලැබුණා.
03.24 දිල්හාරට ගෙවිය යුතු මුළු මුදල 5% වට්ටමකට යටත්ව ගෙව්වා.

**අවශ්‍ය වන්නේ,**
(අ) වට්ටම් තීරු සහිත මුදල් ගිණුමක් පිළියෙල කරන්න. (ල. 4)

iv. සමීරගේ ව්‍යාපාරයේ පොත්තබන්නා විසින් ගිණුම් තැබීමේදී සිදුකර ඇති වැරදි කීපයක් පොත් පත් පරීක්ෂා කිරීමේදී සොයාගත හැකි විය.
(අ) රු. 20000 ගැනුම් ඉන්වොයිසියක් පොත්වල දෙවරක් සටහන් කර තිබුනි.
(ආ) වේතන ලෙස ගෙවන ලද රු. 56000 වේතන ගිණුමේ 65000 ලෙස සටහන් කර තිබුණි.
(ඉ) ණය ගැති දිලුම්ගෙන් රු. 8000 දිලුම්ගේ ගිණුමේ 800 ලෙස සටහන්ව තිබීම.

**අවශ්‍ය වන්නේ,**
1. වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන්.
2. අවිනිශ්චිත ගිණුම.

(07) i. (අ) සුළු මුදල් අග්‍රිමය යන්න හඳුන්වන්න.
(ආ) සුළු මුදල් පොතේ ලෙජරය තීරුවේ සටහන් කරන අයිතම වලට නිදසුන් දෙකක් දෙන්න. (ල. 2)

ii. පහත ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.
(අ) මුදල් පොතේ ලැබීම් සටහන් කරන්නේ ලදුපත අශ්‍රයෙන් වන අතර ගෙවීම් සටහන් කරන්නේ ගෙවීම් වවුචරය ආශ්‍රයෙනි. ( )
(ආ) ගිණුමක හර පැත්ත බැර පැත්තට වඩා වැඩි වේ නම් ලැබෙන ශේෂය බැර ශේෂයකි. ( )

(ඉ) ඉඩදුන් කාලය තුල ණය හිමියන්ට මුදල්ගෙවීමේදී ගෙවිය යුතු ණය වටිනාකමින් ණය හිමියන් කරන අඩු කිරීම දුන් වට්ටමකි. ( )

(ඊ) ජංගම ගිණුමක ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත්කල විට එම චෙක්පත් වලට ගෙවීම් කිරීම නිසා ඇතිවන අගය බැංකු අයිරාවයි. ( )

(ල. 02)

iii. පහත දැක්වෙන්නේ ඉමාෂිගේ ව්‍යාපාරයේ මාර්තු 31 දිනට පිළියෙල කරන ලද බැංකු ගිණුම හා බැංකු ප්‍රකාශයයි.

බැංකු ගිණුම

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම | දිනය | විස්තරය | ස.පි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 18.3.1 | ශේෂය ඉ/ගෙ | | 25000 | 18.3.3 | රුචිනි (චෙ.අ. 26) | | 4000 |
| 18.3.5 | සමන් (චෙ.අ. 12) | | 6000 | 18.3.5 | සමන් (චෙ.අ. 27) | | 11000 |
| 18.3.8 | මුදල් තැන්පත් | | 18000 | 18.3.16 | සිරිමලී (චෙ.අ. 28) | | 13000 |
| 18.3.21 | සුසිල් (චෙ.අං. 60) | | 29000 | 18.3.31 | ශේෂය ප/ගෙ | | 50000 |
| | | | 78000 | | | | 78000 |

2018 මාර්තු මාසයේ බැංකු ප්‍රකාශය

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 18.3.1 | ශේෂය ඉ/ගෙ | | | 25000 |
| 18.3.3 | චෙක්. අං. 26 | 4000 | | 21000 |
| 18.3.6 | චෙක්. අං. 12 | | 6000 | 27000 |
| 18.3.8 | මුදල් තැන්පත් | | 18000 | 45000 |
| 18.3.9 | චෙක්. අං. 27 | 11000 | | 34000 |
| 18.3.21 | ණය ගැති ප්‍රේෂණ | | 16000 | 50000 |
| 18.3.22 | රක්ෂණ වාරික | 6000 | | 44000 |
| 18.3.31 | බැංකු ගාස්තු | 2000 | | 42000 |

**අවශ්‍ය වන්නේ,**

1. සංශෝධනය කරන ලද බැංකු ගිණුම
2. 2018.3.31 බැංකු සැසදුම් ප්‍රකාශය (ල. 06)

iv. පහත දී ඇති ශේෂයන් ඇතුළත් කරමින් අෆ්රා අනස්ගේ ව්‍යාපාරයේ 2018.11.31 දිනට ශේෂ පිරික්සුමක් පිළියෙල කරන්න.

| | |
|---|---|
| මුදල | 45000 |
| ගැනුම් | 148000 |
| විකුණුම් | 186000 |
| ආයෝජන | 200000 |
| කඩ කුලී | 16000 |
| ප්‍රාග්ධනය | 380000 |
| බැංකු ණය | 180000 |
| ලද වට්ටම් | 8000 |
| දුන් වට්ටම් | 5000 |
| මෝටර් රථය | 400000 |
| බැංකු අයිරාව | 32000 |
| ණය ගැති | 56000 |
| ණය හිමි | 84000 |